## ලේකම්තුමියගේ පණිවිඩය



"සුවතාවයෙන් සුභදතාවයෙන් සුන්දරතාවයෙන් පිරුණු නගරයක්" දැක්ම පෙරදැරිව 2025 වර්ෂය සඳහා හොරණ නගර සභාවේ ආර්ථික ප්‍රතිපත්ති හා මූල්‍ය ක්‍රියාකාරීත්වයේ හැසිරවීම පිළිබඳ අයවැය ප්‍රකාශයට පත් කරමි.

නගර සභා ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව පළාත් පාලන ආයතනයක කාර්යභාරය ප්‍රශස්ත මට්ටමින් ජනතාව වෙත හිමිකර දීමට මෙම ඉදිරි අයවැය යටතේ අපේක්ෂා කෙරේ. අයවැය පිළියෙළ කිරීමේදී තිරසර සංවර්ධන අභිමතාර්ථයන්ට අනුගත වෙමින් නව රාජ්‍ය ප්‍රතිපත්තිය වන 'CLEAN SRI LANKA' වැඩසටහන හොරණ පුරවරය තුළ ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණය කිරීම තුළින් වර්තමාන ආර්ථික අභියෝගයන්ද ජයගනිමින් ප්‍රතිපාදන වෙන් කිරීම සිදුකර ඇත. තවද, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, පූර්ණ සහ තිරසර කාර්මීකරණය සහ සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම, සියලු ආකාරයේ දිළිඳු බව දුරු කිරීම, කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ තත්ත්වය නංවාලීම යනාදී වශයෙන් තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සභාවේ ආදායම ප්‍රශස්ත අයුරින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් අතර බෙදා වෙන්කර ඇති බව සතුටින් ප්‍රකාශ කරමි.

සභාවේ වත්කම්, වගකීම් සහ හිමිකම් ප්‍රශස්ථ අයුරින් කළමනාකරණය කිරීම මඟින් නගර සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා සුවදායක පරිසරයක් නිර්මාණය කිරීමේ කටයුතු සංවිධානය කර ඇත. එමෙන්ම කාර්යයන් පහසු කරලීම උදෙසා ඩිජිටල්කරණය කිරීමේ සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයෙහි කේන්ද්‍රස්ථානය වන බස්නාහිර පළාත තුළ සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින නගරයක් වශයෙන් හඳුනා ගෙන ඇති හොරණ නගරය සමෘද්ධිමත් නගරයක් බවට පත් කිරීම උදෙසා මෙවර අයවැය මඟින් ප්‍රශස්ත මූල්‍ය හැසිරවීම සිදුකර ඇති බව තවදුරටත් සඳහන් කරන අතර, 2025 වර්ෂය සියලු ප්‍රජාවට සුභාශිංසන ද මේ සමඟ පිරිනැමීමට අවස්ථාවක් කරගනිමි.

බී.ඩී.ජ්.කේ.ගයන්ති
ලේකම් හා හොරණ නගර සභාවේ බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී
හොරණ නගර සභාව.